# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2088/61 - 2018 සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා - 2018.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* - GODS/ LND/ 05/ACQ/40.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :* 4/3/ 9 /2013/WS/23.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අටකලන්පන්න කෝරළේ, තඹගම් පත්තුව, සුළු කොට්ඨාසයේ බලවින්න ගමේ, අංක 223 බලවින්න උතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 695 දරන පිඹුරේ අතිරේක අංක 10, පත්‍ර අංක 17 හි කැබලි 2691 වශයෙන් පෙන්නුම් කෙරෙන පහත විස්තර කරන ඉඩම් කොටස.

01. කැබලි අංක 2691
ඉඩමේ නම:තලගහකොරටුව, හිඟුරගල යාය, හිගුරගලේ හේන;හිමිකම් කියන අය:රජය; මුල් හිමිකම් කියන අය:ඩබ්ලිව්. එම්. පොඩි අප්පුහාමි, මොරගහ අතුර, බලවින්න, පල්ලේබැද්ද; ප්‍රමාණය: හෙක්. 0.0025.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 ඔක්තෝබර් මස 18 වැනි දින පෙ.ව. 9.00 ට ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2018 ඔක්තෝබර් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ

1A - G 28527- 32 (2018/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ සැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බී. එස්. ජී. රුවන්සිරි,
ප්‍රාදේශීය ලේකම්,
ගොඩකවෙල.

2018 සැප්තැම්බර් මස 07 වැනි දින,
ගොඩකවෙල,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-832

---

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**
7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකයː -* KDS/ HAR/ 4/2/1/23.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය ː* LD/05/2007/WS/340.

2018 ජනවාරි මස 08 දිනැති අංක 2053/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* පලකරන ලද 7 වැනි වගන්තිය දැන්වීම යටතේ නිකුත් කරන ලද දැන්වීමේ සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින්ද බලය ලත් අයවලුන් 2018 මාර්තු මස 26 වැනි දින පෙ.ව. 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය. තවද 2018 මාර්තු මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්භාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම් දිය යුතුයි. යනුවෙන් සඳහන් වී ඇත. එහි සඳහන් **දිනය හා වේලාව 2018 නොවැම්බර් මස 15 දින පෙ.ව. 10.00 ට** යනුවෙන් නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2018 සැප්තැම්බර් මස 11 වැනි දින,
හාරිස්පත්තුව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 833

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.